# BUSINESS PLAN
# (Part - V)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

## මූල්‍ය සැලැස්ම

ව්‍යාපාරයක සියලු ම ඇස්තමේන්තු ගත මූල්‍ය තොරතුරු ඇතුළත් වන කොටස මූල්‍ය සැලැස්ම ලෙස හැඳින්වේ.

## මූල්‍ය සැලැස්මක් සකස් කිරීමේ වැදගත්කම

- ව්‍යාපාර කටයුතු සඳහා අවශ්‍ය අරමුදල් ප්‍රමාණ නිගමනය කිරීමට හා සම්පාදනය කර ගැනීමට.
- ව්‍යාපාරයේ අරමුදල් ආයෝජනය කිරීම පිළිබඳ තීරණ ගැනීමට.
- මුදල් ඌනතාවක් ඇති විය හැකි කාලය හඳුනා ගෙන ඊට පිළියම් යෙදීමට.
- මුදල් අතිරික්තයක් ඇති වන කාලය හඳුනා ගෙන ඒ මුදල් ඵලදායී කටයුතුවල යෙදවීමට.

ClassWork.LK

# මූල්‍ය සැලැස්මක සඳහන් කරුණු

1. ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය (ප්‍රාග්ධන අවශ්‍යතාව)

2. ඇස්තමේන්තුගත ආදායම් ප්‍රකාශය

3. ඇස්තමේන්තුගත මුදල (මුදල් ප්‍රවාහ ප්‍රකාශය)

4. ඇස්තමේන්තුගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

5. ණය ආපසු ගෙවීමේ සටහන

Class Work LK

# 1. ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය

තෝරාගත් ව්‍යාපාර අදහසට අනුව ක්‍රියාත්මක කර පවත්වා ගෙන යාමට බලාපොරොත්තු වන ව්‍යාපෘතිය සඳහා දැරීමට සිදු වන පිරිවැය මේ නමින් හැඳින්වේ.

## ව්‍යාපෘති පිරිවැයක ඇතුලත් කොටස්

- **මුළු ස්ථාවර පිරිවැය**

ව්‍යාපාර කටයුතු අඛණ්ඩ ව පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය වන දිගු කාලීන පැවැත්මක් ඇති වත්කම් සඳහා වන පිරිවැය ස්ථාවර පිරිවැය යි.

නිදසුන් :

- ඉඩම් ගොඩනැගිලි
- යන්ත්‍ර සූත්‍ර
- රථවාහන
- වෙනත් උපකරණ

ClassWork.LK

- **මෙහෙයුම් වියදම්**

මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට පෙර අවශ්‍ය වන වියදම් වේ.

නිදසුන් :

- ඉඩම් සංවර්ධනයට
- ජල විදුලි පහසුකම් ලබා ගැනීමට
- බලපත්‍ර ලබා ගැනීමට
- ව්‍යාපාරය ලියාපදිංචි කිරීමට

- **මුළු කාරක ප්‍රාග්ධනය**

එදිනෙදා ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යාම සඳහා දැරීමට සිදු වන අරමුදල. කාරක ප්‍රාග්ධනය වේ.

නිදසුන් :

- අමුද්‍රව්‍ය ලබා ගැනීමට (සෘජු පිරිවැය)
- නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය දැරීමට
- පරිපාලන පොදු කාර්ය පිරිවැය දැරීමට
- අලෙවි පොදු කාර්ය පිරිවැය දැරීමට

ClassWork.LK

# 2. ඇස්තමේන්තු ගත ආදායම් ප්‍රකාශය

අපේක්ෂිත ආදායම්, අපේක්ෂිත විකුණු භාණ්ඩවල පිරිවැය සහ අපේක්ෂිත මෙහෙයුම් වියදම් දැක්වෙන ලේඛනය ඇස්තමේන්තු ගත ආදායම් ප්‍රකාශය වශයෙන් හැඳින්වේ.

## ඇස්තමේන්තු ගත ආදායම් ප්‍රකාශයක ඇතුළත් කරුණු

- **විකුණුම් ආදායම**

අත් පිට මුදලට විකුණුම් හා ණයට විකුණුම්වලින් ලැබෙන ආදායමෙන් ආපසු එවුම් අඩු කළ පසු ලැබෙන අගය විකුණුම් ආදායම යි.

ClassWork.LK

- **විකුණුම් පිරිවැය**

ව්‍යාපාරයක ආරම්භක තොගයට ගැනුම් හා ගෙන ඒමේ වියදම එකතු කර ආපසු යැවුම් සහ අවසාන තොගය අඩු කළ පසු විකුණුම් පිරිවැය ලැබේ.

- **දළ ලාභය**

විකුණුම් ආදායමෙන් විකුණුම් පිරිවැය අඩු කළ පසු දළ ලාභය ලැබේ.

- **ක්‍රියාකාරී ලාභය**

දළ ලාභයට අයභාර ආදායම් එකතු කර අයභාර වියදම් අඩු කිරීමෙන් පසු ලැබෙන ලාභය ක්‍රියාකාරී ලාභය වේ.

ClassWork.LK

- **බදු පසු ලාභය**

ක්‍රියාකාරී ලාභයෙන් ආදායම් බදු අඩු කළ පසු ලැබෙන ලාභය බදු පසු ලාභය වේ.

## 3. ඇස්තමේන්තු ගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය

යම් අනාගත කාලච්ඡේදයක් තුළ දී ව්‍යාපාරයකට මුදල් ගලා ඒම් සහ ගලායාම් පිළිබඳ ව ඇස්තමේන්තු ඇතුළත් කර පිළියෙළ කරන ලේඛනය ඇස්තමේන්තු ගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය වශයෙන් හඳුන්වයි.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයක යම් කාලච්ඡේදයක මුළු මුදල් ගලා ඒම්, මුළු මුදල් ගලායාම් සහ කාලච්ඡේදය අවසානයේ මුදල් ශේෂය ඇතුළත් වේ.

ClassWork.LK

## ඇස්තමේන්තු ගත මුදල් ප්‍රවාහයක ඇතුළත් තොරතුරු

- **මුදල් ගලා ඒම්**

නිදසුන්:

- අයිතිකරුවන්ගේ ප්‍රාග්ධනය
- ණය සම්පාදනය
- අත්පිට විකුණුම්
- ආදායම් ලැබීම්
- ණයගැති ලැබීම්

ClassWork.LK

- **මුළු මුදල් ගලායාම්**

නිදසුන් :

- ජංගම නොවන වත්කම් මිල දී ගැනීම
- අමු ද්‍රව්‍ය හා වෙළෙඳ භාණ්ඩ මිල දී ගැනීම
- රක්ෂණ, විදුලි, දූරකථන බිල්, ප්‍රවාහණ, බදු වැටුප් ආදිය ගෙවීම
- ණය වාරික ගෙවීම
- බදු ගෙවීම

## 4. ඇස්තමේන්තු ගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

ව්‍යාපාරයක මූල්‍ය තත්ත්වය පෙන්නුම් කරන ලේඛනය ඇස්තමේන්තු ගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශය ලෙස හඳුන්වයි.

ClassWork.LK

## ඇස්තමේන්තු ගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශයක ඇතුළත් කරුණු

- **ජංගම නොවන වත්කම්**

වර්ෂයකට වඩා වැඩි කාලයක් පාවිච්චි කිරීමේ අරමුණින් අත්පත් කර ගෙන ඇති වත්කම් ජංගම නොවන වත්කම් වේ.

නිදසුන් :

- ඉඩම් ගොඩනැගිලි
- යන්ත්‍ර සූත්‍ර
- රථවාහන උපකරණ

ClassWork.LK

- **ජංගම වත්කම්**

වර්ෂයක් හෝ ඊට අඩු කාල සීමාවක් හෝ තුළ නිතර නිතර වෙනස් වන සම්පත්.

නිදසුන් :

- තොගය
- ණයගැති
- මුදල්
- බැංකු මුදල්

- **ජංගම නොවන වගකීම්**

නිදසුන් :

- බැංකු ණය

ClassWork.LK

- **ජංගම වගකීම්**

නිදසුන් :

- ණය හිමියෝ
- ගෙවිය යුතු වියදම්
- උපචිත බදු

- **ණය ආපසු ගෙවීමේ සටහන**

ව්‍යාපාරය ලබා ගත් ණය මුදල්, ණය මුදල හා පොලිය ආපසු ගෙවන ආකාරය, කාලච්ඡේදය ආරම්භයේ හා අවසානයේ ණය ශේෂය ආදි විස්තර මෙහි ඇතුළත් වේ.

නිදසුන් :

- ණයහිමියෝ
- ගෙවිය යුතු වියදම්
- උපචිත බදු

ClassWork.LK

# ව්‍යාපෘති සාරාංශය

ඇස්තමේන්තුගත පිරිවැය, ආදායම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ණය ආපසු ගෙවීමේ සටහන, ඇස්තමේන්තුගත මූල්‍ය තත්ව ප්‍රකාශය ආදියේ දැක්වෙන තොරතුරුවල සාරාංශගත ලේඛනය ව්‍යාපෘති සාරාංශය ලෙස හැඳින්වේ.

ClassWork.LK

# මූල්‍ය සැලැස්ම

ව්‍යාපෘති පිරිවැය

| අයිතමය | යෝජිත | | මුළු මුදල |
|---|---|---|---|
| | ව්‍යාපාරිකයා | බැංකු ණය | රු. |
| • ජංගම නොවන වත්කම් | | | |
| ▪ ඉඩම් හා ගොඩනැගිලි | ……... | …….. | …….. |
| ▪ යන්ත්‍ර හා උපකරණ | ……... | …….. | …….. |
| ▪ ලී බඩු හා සවි කිරීම් | ……... | …….. | …….. |
| ▪ මෝටර් රථ | | | |
| ▪ …………………………… | ……... | …….. | ……. |
| ▪ ජංගම නොවන වත්කම් මුළු එකතුව Ⓐ | ……... | …….. | …….. |
| • මෙහෙයුම් පෙර වියදම් | | | |
| ▪ ව්‍යාපාරය ලියාපදිංචි කිරීමට | ……... | …….. | …….. |
| ▪ ව්‍යාපාර සැලැස්ම පිළියෙළ කිරීමට | ……... | …….. | …….. |
| ▪ ජලය හා විදුලිය ලබා ගැනීමට | ……... | …….. | …….. |
| ▪ මෙහෙයුම් පෙර වියදම් මුළු එකතුව Ⓑ | ……... | …….. | …….. |
| • කාරක ප්‍රාග්ධනය | | | |
| ▪ මුළු පිරිවැය | ……... | …….. | …….. |
| ▪ නිෂ්පාදනයේ පොදු කාර්ය පිරිවැය | ……... | …….. | …….. |
| ▪ අලෙවි පොදු කාර්ය පිරිවැය | ……... | …….. | …….. |
| ▪ පරිපාලන පොදු කාර්ය පිරිවැය | ……... | …….. | …….. |
| කාරක ප්‍රාග්ධන මුළු එකතුව Ⓒ | | | |
| මුළු ව්‍යාපෘති පිරිවැය Ⓐ + Ⓑ + Ⓒ | ……….. | ……….. | ……….. |

ClassWork.LK

# ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| අයිතමය | රු. |
|---|---|
| මුදල් ගලා ඒම | |
| අයිතිකරුගේ මුදල් | |
| විකුණුම් ආදායම් | |
| මුළු මුදල් ගලා ඒම් | |
| අඩු කළා : මුදල් ගලා යාම් | |
| ඉඩම් හා ගොඩනැගිලි මිල දී ගැනීම් | |
| යන්ත්‍ර හා උපකරණ මිල දී ගැනීම් | |
| වෙනත් ස්ථාවර වත්කම් මිල දී ගැනීම් | |
| මෙහෙයුම් පෙර වියදම් | |
| මුළු ඍජු පිරිවැය | |
| නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය | |
| අලෙවි පොදු කාර්ය පිරිවැය | |
| පරිපාලන පොදු කාර්ය පිරිවැය | |
| බදු ගෙවීම් | |
| ආදායම් බදු ගෙවීම් | |
| වෙනත් ගෙවීම් | |
| ................................... | |
| ................................. | |
| මුළු මුදල් ගලා යාම් Ⓑ | |
| අවසාන මුදල් ශේෂය Ⓐ - Ⓒ | |

ClassWork.LK

## .................................. ව්‍යාපාරය

## .................................. දිනෙන් අවසන් වර්ෂය සඳහා

## ආදායම් ප්‍රකාශය

| | | |
|---|---|---|
| විකුණුම් ආදායම<br>අඩු කළා : වැට් බදු | | |
| ශුද්ධ විකුණුම් ආදායම<br>අඩු කළා :<br>• මුළු සෘජු පිරිවැය<br><br>දළ ලාභය | | |
| අඩු කළා :<br>• නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය<br>• අලෙවිකරණ පොදු කාර්ය පිරිවැය<br>• පරිපාලන පොදු කාර්ය පිරිවැය | | |
| ක්‍රියාකාරී ලාභය | | |
| අඩු කළා :<br>• ක්ෂය වීම්<br>• ණය පොළී | | |
| බදු පෙර ශුද්ධ ලාභය | | |
| අඩු කළා :<br>• ආදායම් බදු | | |
| බදු පෙර ශුද්ධ ලාභය / මෙහෙයුම් ලාභය | | |

ClassWork.LK

........................................

## ............................... දිනට ඇස්තමේන්තුගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| අයිතමය | පිරිවැය | සමුච්චිත | ධාරණ |
|---|---|---|---|
| ජංගම නොවන වත්කම්<br>මෝටර් රථ<br>යන්ත්‍ර හා උපකරණ<br>ලී බඩු හා උපකරණ<br>වෙනත් | | | |
| මුළු ජංගම නොවන වත්කම් | A | | |
| ජංගම වත්කම්<br>මුදල්<br>(මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අවසාන ශේෂය)<br>අවසාන තොගය | | | |
| මුළු ජංගම වත්කම් | B | | |
| මුළු වත්කම් A + B | | | |
| වගකීම්<br>ජංගම වගකීම්<br>......................<br>(තිබේ නම් පමණක්) | C | | |
| ජංගම නොවන වගකීම්<br>............................<br>(තිබේ නම් පමණක්) | D | | |
| ව්‍යාපාරයේ යෙදවුම් (ප්‍රාග්ධනය)<br>ශුද්ධ ලාභය | | | |
| මුලු යෙදවුම් | E | | |
| මුලු වගකීම් C + D + E | | | |

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550


S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura